පොළොන්නරුව ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**
---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-----------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 18 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන ගාස්තු, උසාවි දඩ ආදායම්, මුද්දර ගාස්තු ආදායම් උපචිත පදනම මත ගිණුම් තබා නොතිබුණි. | ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුවේ. | විගණන ගාස්තු වල ඇස්තමේන්තු මුදල නොලැබුණු නිසා උපචිත පදනමට හඳුනා ගැනීමට නොහැකි විය. ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කර ඇත. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් හා සුසාන භූමි 04 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් හා සුසාන භූමි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දේපල සමීක්ෂණයෙන් වත්කම් හඳුනාගෙන ඇත. ඉදිරියේදී ගිණුම්ගත කරමි. |
| (ii) | 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසවලට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හා | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අදාල | අදාල ආයතන වෙතින් උපලේඛන නොලැබීම මත |

| | | | |
|---|---|---|---|
| | 2019 දෙසැම්බර් මාසයට අදාලව ලැබිය යුතු උසාවි දඩ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වගකිව යුතු ආයතනවලින් තොරතුරු ලබාගත යුතුවේ. | ගිණුම්ගත කිරීමට නොහැකි විය. |
| (iii) | තැන්පත් කරුවන් 07 දෙනෙකු සඳහා ආපසු ගෙවිය යුතු තැන්පත් රු. 140,000 ක් මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු ශේෂයෙන් අත්හැරී තිබුණි. | සැසඳීම් කර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව වැලි ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කළ යුතුවේ. | ආයතනයෙන් අදාල මුදල පිළිබඳව විමසීම් කලද පිළිතුරු නොලැබුණි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයන් 41 දෙනෙකුගෙන් අයවිය යුතු රු.49,940 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලැබිය යුතු ජල ගාස්තු ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

**(ඇ) නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | උසාවි දඩ ආදායම් ලේඛනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.14,684,087 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.16,454,899 ක් වූයෙන් රු.1,770,812 ක නොසැසඳීමක් පැවතුණි. | සැසඳීම් කර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හේතු හඳුනාගෙන ඇත. ඉදිරියේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව කර්මාන්ත ණයගැති ශේෂය රු.19,713,995 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව එම ශේෂය රු.21,657,410 ක් වූයෙන් රු.1,943,415 ක වෙනසක් පැවතුණි. | ශේෂ සැසඳීම් කර නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතුවේ. | ශේෂ වෙනස හඳුනාගෙන ඇත. 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ණයහිමි ශේෂය රු.21,494,340 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව එම ශේෂය රු.23,590,629 ක් වූයෙන් රු.2,096,289 ක වෙනසක් පැවතුණි. | ශේෂ සැසඳීම් කර නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතුවේ. | ශේෂ වෙනස හඳුනාගෙන ඇත. 2020 වර්ෂයේදී නිවැරදි කිරීම් කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

(i) තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.46,771,802 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී සකස් කර ඉදිරිපත් කරමි. ආරම්භක හිඟ උසාවි දඩ හා පොදු ගිණුම් ශේෂ තමන්කඩුව ප්‍රාදේශීය සභාව ඇවර කිරීමේදී ලද ශේෂ වේ. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත | | | |
| | 16(2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුවේ. | වාර්තාව සකස් කර ඉදිරිපත් කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | | | |
| (i) | 59 රීතිය | ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර කර්මාන්ත හඳුනාගත යුතුවේ. | 2020 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදුකර ඇත. |
| (ii) | 203 රීතිය | සභාවේ දේපල පිළිබඳ පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පූර්ණ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | පූර්ණ සමීක්ෂණයක් කර ඇත. වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------- | | | |
| (i) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛනයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි371(5) | අදාල කාර්යය නිමකර දින 10 ක් ඇතුලත ලබාගත් අත්තිකාරම් මුදල පියවිය යුතු වුවත්, අවස්ථා 07 කදී ලබාදී තිබුණු රු.100,000 ක් වටිනා අත්තිකාරම් මුදල් දින 16 සිට දින 187 ක් දක්වා කාලයක් ප්‍රමාදවී පියවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කාල ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවිය යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | වෙනත් චක්‍රලේඛ<br>----------------- | | | |
| | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක 02/2017 දරණ 2017 දෙසැම්බර් 27 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | පොළොන්නරුව ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ කම්පැක්ටර් රථයේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මස තුලදී එය පවරා ගැනීමට කටයුතු කරමි. |

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම<br>------------- |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැති ලෙස දක්වා තිබුණු රු.19,713,996 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට කර්මාන්ත ණයගැති රු.12,487,033 ක් ලැබී ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයහිමි ලෙස දක්වා තිබූ රු.23,590,629 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත ණයහිමි රු.11,460,160 ක් ගෙවා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,442,547 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,516,030 | 2,850,403 | 1,771,193 | 1,079,210 |
| කුලී | 1,724,608 | 2,472,716 | 2,472,716 | - |
| බලපත්‍ර ගාස්තු | 578,500 | 440,265 | 440,265 | - |
| වෙනත් ආදායම් | 23,879,100 | 40,531,819 | 10,582,777 | 29,949,042 |
| එකතුව | 27,698,238 | 46,295,203 | 15,266,951 | 31,028,252 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම්<br>සමාලෝචිත වර්ෂයේ එකතු කල යුතු වරිපනම් බදු මුදල වූ රු.1,466,110 කින් රැස්කර තිබුණේ සියයට 38 ක් වූ රු.560,042 කි. | වරිපනම් බදු එකතු කිරීමේ කාර්යය කාර්යක්ෂම කළ යුතුවේ. | තවදුරටත් ජංගම සේවා පවත්වා වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) වරිපනම් බදුකරුවන් 49 දෙනෙකුගෙන් දිගින් දිගටම වාර්ෂිකව අයවිය යුතු බදු මුදල් අයනොකිරීම නිසා වසර 05 කට අධික කාලයක් තිස්සේ අය නොවූ රු.317,739 ක් පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා කටයුතු කිරීම් සිදුකර ඇත. |

**(ඇ) කසල බදු ආදායම්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා කසල බදු අය කිරීමට ගැසට් කර තිබුණද, කසල බදු අය කළ හැකි ආයතන පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබීම හේතුවෙන් සභාවට අයකර ගත හැකිව තිබූ කසල බදු ආදායම අහිමි වී තිබුණි. | කසල බදු අයකළ යුතු ආයාතන හඳුනාගෙන ගාස්තු අයකළ යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයට අදාලව කසල බදු අයකළ හැකි ආයතන සම්බන්ධයෙන් ලේඛනයක් සකස් කිරීම කර ඇත. |

**(ඈ) ජල බදු ආදායම්**

| | | |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් 31 වන විට සභාවට ලැබිය යුතු මුළු හිඟ ආදායම රු.48,433 ක් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.84,315 ක් වූ හිඟ ජල ගාස්තුවෙන් 2020.05.27 වන විට රු.35,882 ක් අයකරගෙන ඇත. |

## 2.2.3 කුලී

**(අ) යන්ත්‍ර කුලී ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා බැකෝ ලෝඩරය කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් අයවිය යුතු රු.297,025 ක මුදල අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී රු.246,025 ක මුදලක් ලැබී ඇත. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් යවා ඇත. |

## 2.2.4 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ප්‍රචාරක දැන්වීම් ගාස්තු** | | |
| | සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු විශාල ප්‍රමාණයක් නිරීක්ෂණය වුවද, ඒවා හඳුනාගෙන ආදායම් රැස්කිරීමට සභාව අපොහොසත්වී තිබුණි. | සමීක්ෂණයක් පවත්වා ආදායම හඳුනාගත යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකර ආදායම් රැස් කිරීමට කටයුතු කරමි. |

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 | අදාල වගකිව යුතු ආයතන වෙතින් මුදල් | පළාත් සභාවේ ආණ්ඩුකාර තැන වෙතින් මුදල් ලබාදෙන |

| | | |
|---|---|---|
| දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.16,454,899 ක් හා මුද්දර ගාස්තු රු.13,494,143 ක් විය. | ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | ලෙස ඉල්ලීම් කර ඇත. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛවිහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු නිවැරදි කර සකස් කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණද, එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. 2017, 2018 හා 2019 වර්ෂවල තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | සභාවට අදාලව අරමුණු හඳුනා ගැනීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම, මූල්‍ය ප්‍රතිපාදන කිරීම සම්බන්ධිත ආයතන හඳුනාගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ වත්කම් බෙදාදීමේදී පොළොන්නරුව ප්‍රාදේශීය සභාව | උපාංග ආපසු ලබාගැනීමට හෝ නිරවුල් | පොළොන්නරුව මහා නගර සභාව වෙත ලිඛිතව දැනුම් |

| | | | |
|---|---|---|---|
| | සතු පරිගණක හා උපාංග කිහිපයක් පොළොන්නරුව මහා නගර සභාව විසින් භාවිතා කරනු ලැබුවද, ඒවා ආපසු ලබාගැනීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කරගැනීමට කටයුතු කළ යුතුවේ. | දුන්නද මෙතෙක් භාරදීමට කටයුතු කර නොමැත. |
| **3.3** | **මානව සම්පත් කළමනාකරණය** | | |
| 3.3.1 | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (අ) | ලේකම් තනතුර 2017 ජූලි සිට පුරප්පාඩුව පවතින අතර, වැඩබලන ලේකම්වරියක එම තනතුරේ රාජකාරි ආවරණය කරමින් පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අවස්ථා කිහිපයකදී පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| (ආ) | ප්‍රාථමික හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 32 ක් පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අවස්ථා කිහිපයකදී පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| 3.3.2 | සේවක ණය | | |
| (අ) | 2013 සිට 2017 දක්වා කාලය තුල ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.64,585 ක ණය ශේෂයක්ද, 2016 වර්ෂයේ මිය ගිය අයෙකුගේ රු.7,800 ක ණය ශේෂයක්ද, 2019 විශ්‍රාම ගිය සේවකයෙකුගෙන් රු.3,600 ක ණය ශේෂයක්ද අයකරගෙන නොතිබුණි. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දැනුවත් කර ඇත. විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් විශ්‍රාම වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇත. මියගිය නිලධාරියාගේ ශේෂය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් පතා ඇත. |
| (ආ) | 2015 වැඩ තහනම් කර ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.7,680 ක ණය මුදල හා සේවය හැර ගිය නිලධාරීන්/ සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.17,500 ක විශේෂ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. | ලේඛනාගාරයේ ලිඛිත සාක්ෂි නොමැති බැවින් උපදෙස් පතා පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් යවන ලදී. |

**3.4 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| සභාව සතු අඟුලක් හා ට්‍රැක්ටරයක් වසර 03 ත් 10 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි. | නිෂ්ක්‍රීය වත්කම් හඳුනාගෙන උපයෝජනය හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019.12.31 දින භාණ්ඩ සමීක්ෂණයේ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසි කිරීම සඳහා තාක්ෂණ කමිටු නිර්දේශයක් ලබාගැනීමට කටයුතු කර ඇත. |

**4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1** අභ්‍යන්තර විගණනය

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව විගණන හා කළමනාකරණ කමිටු 03 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | පිළිගනිමි. |